# 05. මහාමඞ්ගලසුත්තං

## පඤ්චමො පාදෝ



බහූ දේවා මනුස්සා ච
මඞ්ගලානි අචින්තයුං
ආකඞ්ඛමානා සොත්ථානං
බ්‍රෑහි මඞ්ගලමුත්තමං

අසෙවනා ච බාලානං - පණ්ඩිතානඤ්ච සෙවනා
පූජා ච පූජනීයානං - එතං මඞ්ගලමුත්තමං

පතිරූපදෙසවාසො ච - පුබ්බෙ ච කතපුඤ්ඤතා
අත්තසම්මාපණිධි ච - එතං මඞ්ගලමුත්තමං

බාහුසච්චඤ්ච සිප්පඤ්ච - විනයො ච සුසික්ඛිතො
සුභාසිතා ච යා වාචා - එතං මඞ්ගලමුත්තමං

මාතාපිතු උපට්ඨානං - පුත්තදාරස්ස සඞ්ගහො
අනාකුලා ච කම්මන්තා - එතං මඞ්ගලමුත්තමං

(මහාමඞ්ගලසුත්තං)

## වචන මාලාව

| | | |
|---|---|---|
| අසෙවනා | - | සේවනය නොකිරීම |
| බාලානං | - | අඥාන සත්ත්වයන්ගේ |
| පූජනීයානං | - | පිදිය යුත්තන්ට |
| පතිරූපදෙස | - | වාසයට සුදුසු ප්‍රදේශ |
| කතපුඤ්ඤතා | - | කරන ලද පින් ඇති බව |
| අත්තසම්මාපණිධි | - | තමා මනාකොට පිහිටීම |
| බාහුසච්චඤ්ච | - | බහුශ්‍රැත බව ද |
| සිප්පඤ්ච | - | ශිල්ප දැනීම ද |
| සුසික්ඛිතො | - | මනාකොට හික්මීම ලද |
| සුභාසිතා වාචා | - | යහපත් වචන |
| පුත්තදාරස්ස | - | අඹු දරුවන්ට |

## පඨමා විභත්තිය

සිව්වැනි පාඩමේ දී අපි විභක්ති නවයක් උගත්තෙමු. ඒවා අපට වැදගත් වන්නේ පාලි වාක්‍ය සාදා ගැනීම සඳහා ය. එසේ ම පාලි වාක්‍යවල අර්ථ හඳුනා ගැනීම සඳහා ය. මේ පාඩමේ සඳහන් වූ ගාථාවල යෙදුණු පද කිහිපයක් පහත දක්වේ.

***දෙවා, මනුස්සා, බාලා, පණ්ඩිතා, මාතා, දෙසං***

- ඉහත පද යෙදී ඇත්තේ පඨමා විභක්තියෙනි.
- එම පද ඒකවචන, බහුවචන වශයෙන් දෙවැදෑරුම් ය.
- ඉහත සඳහන් පද පුරුෂලිංග, ස්ත්‍රීලිංග, නපුංසකලිංග යන ලිංගත්‍රයට බෙදා දක්විය හැකි ය.

## අභ්‍යාසය 05 1

1. මහාමඞ්ගල සූත්‍රය දේශනා කළේ කාහට ද?
2. පාඩමේ එන ගාථාවල දැක්වෙන මඞ්ගල කරුණු සොයා ලියන්න.
3. එහි දැක්වෙන නාම පද පහක් තෝරා ලියන්න.
4. එහි තිබෙන ක්‍රියා පද දෙකක් තෝරා ලියන්න.
5. එම ගාථා පන්තිය පාළි රීතිය නොබිඳ තාලයට සජ්ඣායනා කරන්න.

පඨමා විභත්තියේ නාම වරනැගෙන ආකාරය බලන්න.

| පඨමා විභත්තිය | | |
|---|---|---|
| නාමය | ඒකවචන | බහුවචන |
| බුද්ධ | බුද්ධො | බුද්ධා |
| අග්ගි | අග්ගි | අග්ගී, අග්ගයො |
| දණ්ඩී | දණ්ඩී | දණ්ඩී, දණ්ඩිනො |
| භික්ඛු | භික්ඛු | භික්ඛූ, භික්ඛවො |
| කඤ්ඤා | කඤ්ඤා | කඤ්ඤා, කඤ්ඤායො |
| නදී | නදී | නදී, නදියො, නජ්ජො |
| චිත්ත | චිත්තං | චිත්තා, චිත්තෙ, චිත්තානි |
| සබ්බ | සබ්බො | සබ්බෙ |
| ඉම | අයං | ඉමෙ |